# වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

## නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

# 2018 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කරගැනීම

ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ධාරාව සහ
අ.පො.ස. උසස් පෙළ 2017

### අයදුම්පත් කැඳවීම

**අධ්‍යයන කාලය : අවුරුදු 03**

**මාධ්‍යය : ඉංග්‍රීසි**

**අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය : 2018 ජනවාරි 24**

NVQ 5 **හෝ ඊට සමාන ඩිප්ලෝමා පාඨමාලාවන් හැදෑරූ අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන තරඟ විභාගය පැවැත්වෙන දිනය : 2018 පෙබරවාරි 18**

උක්ත විභාගය පිළිබඳ අයදුම්කරුවන් දැනුවත් කරනු ලබන අතර තමන් ඊට සුදුසුකම් ලැබිය යුතු වුවත් එලෙස දැනුම් දීමක් 2018 පෙබරවාරි 16 දින තෙක් නොලබන්නේ නම් ඒ පිළිබඳ විශ්වවිද්‍යාලයෙන් විමසීම අයදුම්කරුවන්ගේ වගකීම වේ.

NVQ 5 හෝ ඊට සමාන ඩිප්ලෝමා පාඨමාලාවන් හැදෑරූ අයදුම්කරුවන් වෙනුවෙන් ප්‍රමුඛතාවය ලබා දෙමින් ඉතිරි පුරප්පාඩු සඳහා **අ.පො.ස. උසස් පෙළ සමත් සිසුන්ගේ Z අගය** පදනම් කර ගනිමින් ඔවුන් සඳහා අවස්ථාව ලබා දේ.

## ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ධාරාව (සතියේ දින සහ සතිඅන්ත පාඨමාලා)

### තාක්ෂණවේදී උපාධි පාඨමාලා (Bachelor of Technology Degree Programmes )

| තාක්ෂණවේදී උපාධි පාඨමාලා | ඇතුළත්වීම සඳහා අවශ්‍ය විශේෂ තාක්ෂණික ක්ෂේත්‍රයන් |
|---|---|
| I) මෙකාට්‍රොනික් තාක්ෂණය | - මෙකාට්‍රොනික්, විදුලි, විද්‍යුත්, යාන්ත්‍රික, නිෂ්පාදන සහ මෝටර් රථ තාක්ෂණය, ජෛව වෛද්‍ය |
| ii) ගොඩනැගිලි සේවා තාක්ෂණය | - ඉදිකිරීම්, සිවිල්, යාන්ත්‍රික, ශීතකරණ හා වායුසමීකරණ, විදුලි, ගොඩනැගිලි සේවා, විද්‍යුත් සහ විදුලි සංදේශ |
| iii) නිෂ්පාදන තාක්ෂණය | - නිෂ්පාදන, මෙකාට්‍රොනික්, ශීතකරණ හා වායුසමීකරණ, යාන්ත්‍රික, මෝටර් රථ තාක්ෂණය, පැස්සුම්, කෘෂි යන්ත්‍රෝපකරණ, රසායනික සහ බහු අවයවීක තාක්ෂණය |
| iv) ආහාර සැකසුම් තාක්ෂණය | - ආහාර, කෘෂිකර්ම, සූපවේදය, පශු සම්පත් සහ කිරි නිෂ්පාදන, ආහාර තත්ව සහ ආහාර රසායනය විද්‍යාව |
| v) මෘදුකාංග තාක්ෂණය | - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය |
| vi) බහුමාධ්‍ය සහ වෙබ් තාක්ෂණය | - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය |
| vii) ජාල තාක්ෂණය | - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, විදුලි සංදේශ |
| viii) කර්මාන්ත කළමනාකරණ තාක්ෂණය | - ඕනෑම තාක්ෂණික හෝ වෘත්තිය ක්ෂේත්‍රයක් |
| ix) සිනමා සහ ටෙලිවිෂන් නිෂ්පාදන තාක්ෂණය | - සිනමා, ටෙලිවිෂන්, වීඩියෝ නිෂ්පාදනය සහ මාධ්‍ය තාක්ෂණය |
| x) ප්‍රමාණ සමීක්ෂණ | - ප්‍රමාණ සමීක්ෂණය |
| xi) ඉදිකිරීම් තාක්ෂණය සහ සම්පත් කළමනාකරණය | - ඉදිකිරීම් තාක්ෂණය |

(i) – (iii): Sydney සම්මුතිය යටතේ IESL ප්‍රතීතනය ලබාගෙන ඇත.

**ඇතුළත්වීමේ සුදුසුකම්**

I. ඉහත සඳහන් කරන ලද අදාළ තාක්ෂණික ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 *
**හෝ**
ii. HNDE, HNDQS, HNDA, NDT, NDES, NDET හෝ ඉහත දක්වා ඇති අදාළ තාක්ෂණික ක්ෂේත්‍රයේ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සභාව විසින් පිළිගන්නා සුදුසුකම්
**හෝ**
iii. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් 5 හෝ 6 මට්ටමට සමාන යැයි පිළිගනු ලැබූ සුදුසුකමක්. (ඒ සඳහා නිකුත් කරනු ලැබූ ලිඛිත සහතිකයක් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුයි.)

ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 6 හෝ සමාන සුදුසුකම්හි අදාළ මොඩියුල සහ උපාධි පාඨමාලාවන්හි අඩංගු මොඩියුල පිළිබඳ විධිමත් ඇගයීමකින් පසුව උපාධි පාඨමාලාවේ යම් මොඩියුල හැදෑරීමෙන් අයදුම්කරුවන් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

**විශේෂ සටහන**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ අධ්‍යාපන අමාත්‍යංශය අතර ඒකාබද්ධ වැඩසටහනක් යටතේ ඉහත සඳහන් තාක්ෂණවේදී උපාධි පාඨමාලා (v),(vi) සහ (vii) සඳහා රජයේ පාසැල්වල තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විෂයය උගන්වන ගුරුවරුන් හට විශේෂ අවස්ථාවක් ලබා දීමට සැලසුම් කොට ඇත. අදාළ ගුරුවරුන් www.moe.gov.lk වෙබ් අඩවියට පිවිස එහි අඩංගු උපදෙස්වලට අනුව අධ්‍යාපන අමාත්‍යංශයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය මඟින් අයදුම් කළ යුතුයි.

### අධ්‍යාපන තාක්ෂණවේදී උපාධි පාඨමාලා (Bachelor of Education Degree Programmes)

#### අධ්‍යාපන තාක්ෂණවේදී උපාධිය

**ඇතුළත්වීමේ සුදුසුකම්**

1. ඉහත සඳහන් කරන ලද අදාළ තාක්ෂණික ක්ෂේත්‍රහි ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 *
**හෝ**
2. විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සභාව මගින් පිළිගනු ලබන ඉහත සඳහන් කරන ලද අදාළ තාක්ෂණික ක්ෂේත්‍රහි HNDE,NDT,NDES,NDET,NDICT සුදුසුකම්
**හෝ**
3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් 5 හෝ 6 මට්ටමට සමාන යැයි පිළිගනු ලැබූ සුදුසුකමක්. (ඒ සඳහා නිකුත් කරනු ලැබූ ලිඛිත සහතිකයක් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුයි.)
**හෝ**
4. ජාතික අධ්‍යාපන පීඨයන්හි ලබා දෙන පුහුණුව යටතේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් පිරිනමනු ලබන (ඉහත තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අදාළ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සභාව විසින් පිළිගනු ලබන) ඩිප්ලෝමා සහතිකය.

අදාළ සහතිකය ලබා ගැනීමෙන් පසු එම ක්ෂේත්‍රයන්හි ඉගැන්වීම හෝ කර්මාන්ත ආශ්‍රිත අවම වශයෙන් අවුරුදු 01 ක පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාව හිමිවේ.

#### අධ්‍යාපනවේදී උපාධිය (ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම)

**ඇතුළත්වීමේ සුදුසුකම්**

1. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ඉංග්‍රීසි සහ අධ්‍යාපනය පිළිබඳ NVQ 5 ඩිප්ලෝමා සහතිකය හෝ NVQ 6 උසස් ඩිප්ලෝමා සහතිකය
2. ජාතික අධ්‍යාපන ආයතනය මගින් අධ්‍යාපන පීඨ වල පවත්වන ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ජාතික ඩිප්ලෝමාව
**හෝ**
3. ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය හෝ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මගින් පිරිනැමූ ජාතික පුහුණු තාක්ෂණ ඩිප්ලෝමාව (ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම)
**හෝ**
4. ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනය මගින් පිරිනැමූ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව
**හෝ**
5. අධ්‍යාපන අමාත්‍යංශයේ ඉංග්‍රීසි පුහුණු ගුරු සහතිකය
**හෝ**
6. ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය හෝ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මගින් පිරිනැමූ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව සහ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සභාව විසින් පිළිගනු ලබන ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම ඇතුළත් වන සුදුසුකම් සහතිකයක්

සටහන

* තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තහවුරු කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 ට සමාන සුදුසුකම්

## අ.පො.ස. උසස් පෙළ ධාරාව - 2017 (සතියේ දින පාඨමාලා පමණි)

### 2017 අ.පො.ස (උ/පෙ) විභාගය සමතුන් වෙතින් පහත උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| උපාධි පාඨමාලා | සුදුසුකම් ලබන උසස් පෙළ ධාරාවන් |
|---|---|
| I) මෙකාට්‍රොනික් තාක්ෂණය | - ඉංජිනේරු තාක්ෂණවේදය |
| ii) ගොඩනැගිලි සේවා තාක්ෂණය | - ඉංජිනේරු තාක්ෂණවේදය |
| iii) නිෂ්පාදන තාක්ෂණය | - ඉංජිනේරු තාක්ෂණවේදය |
| iv) ආහාර සැකසුම් තාක්ෂණය | - ජෛව පද්ධති තාක්ෂණවේදය, ජෛව විද්‍යාවන් |
| v) මෘදුකාංග තාක්ෂණය | - උසස් පෙළ ඕනෑම විෂය ධාරාවක් සමග තොරතුරු සන්නිවේදන තාක්ෂණය විෂයක් ලෙස |
| vi) බහුමාධ්‍ය සහ වෙබ් තාක්ෂණය | - උසස් පෙළ ඕනෑම විෂය ධාරාවක් සමග තොරතුරු සන්නිවේදන තාක්ෂණය විෂයක් ලෙස |
| vii) ජාල තාක්ෂණය | - උසස් පෙළ ඕනෑම විෂය ධාරාවක් සමග තොරතුරු සන්නිවේදන තාක්ෂණය විෂයක් ලෙස |
| viii) කර්මාන්ත කළමනාකරණ තාක්ෂණය | - වාණිජ, ඉංජිනේරු තාක්ෂණවේදය, භෞතීය විද්‍යා |
| ix) ඉදිකිරීම් තාක්ෂණය සහ සම්පත් කළමනාකරණය | - ඉංජිනේරු තාක්ෂණවේදය |
| x) අධ්‍යාපන තාක්ෂණවේදී උපාධිය | - වාණිජ, භෞතීය විද්‍යා, ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛවීය විද්‍යාවන් හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය |
| xi) අධ්‍යාපනවේදී උපාධිය (ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම) | - අ.පො.ස. උසස් පෙළ ඉංග්‍රීසි විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ අ.පො.ස. උසස් පෙළ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් |

එක් අයදුම්කරුවෙකුට යොමුකළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත www.univotec.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක. දැනට ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් පමණක් තම අයදුම්පත අදාළ ආයතනයේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් ලිපිනයට 2018 ජනවාරි මස 24 වන දිනට හෝ එයට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන උපාධි පාඨමාලාව සහ NVQ ධාරාවෙන් හෝ අ.පො.ස. උසස් පෙළ ධාරාවෙන් අයදුම් කරන්නේද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුය. අයදුම්පත් යොමු කිරීම සඳහා රු. 500 ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ලංකා බැංකුව, රත්මලාන ශාඛාවේ ගිණුම් අංක 0070308457 ට බැර කළ යුතු අතර අයදුම්පත සමඟ අදාළ මුදල් ගෙවූ ලදුපත සහ සුදුසුකම් සහතිකයේ පිටපත අමුණා එවිය යුතුය. අයදුම්කිරීම අන්තර්ජාලය හරහා ද කළ හැකි අතර අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට ලැබෙන **"Confirmation Copy"** පණිවිඩයෙහි මුද්‍රණය කරගත් පිටපත, සුදුසුකම් සහතිකයේ පිටපත සමඟ මුදල් ගෙවූ ලදුපත ඉහත සඳහන් ආකාරයට විශ්වවිද්‍යාලය වෙත යොමු කළ යුතුය. (වැදගත් - අයදුම් කිරීම සඳහා එක් ක්‍රමවේදයක් පමණක් භාවිතා කරන්න). අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.


අධ්‍යක්ෂ ජනරාල්
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
100, කඳවල, රත්මලාන

දුරකථන : 0112 630700 දිගු අංක : 1100 / 1101 / 1102
ශිෂ්‍ය සේවා අංශය : 0112 630701 ෆැක්ස් : 0112 630705


වැඩිදුර තොරතුරු සඳහා වෙබ් අඩවියට පිවිසෙන්න
www.univotec.ac.lk

2008 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත,
පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකත්වය දරණ රාජ්‍ය විශ්වවිද්‍යාලයකි.